
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam




# අරාබි අපායට නියමවුණු ලාංකික අසරණයෝ

රිසානා නෆීක් නම් 22 වියැති ශ්‍රීලාංකික තරුණිය සවුදි අරාබියාවේදී මිනීමැරුම් වරදකට අසුවී එහි උසාවියේ දුන් තීන්දුවක් අනුව දැන් හිස ගසා මරාදමන දඬුවම ලැබ දිනය එන තුරු සිරගෙදර සිටී. ඇය වෙනුවෙන් කතා-කරන්නට කෙනෙකු සිටියේ නැත. රිසානා කියන දේ අරාබිකාරයින්ට තේරුනේ නැත. ඔවුන් කියන දේ, උසාවියේ කතාකරන දේ රිසානාට තේරුණේ නැත. ඇය වෙනුවෙන් පෙනී සිටින්නට ලංකා රජය නීතිඥයෙකු යැවුවේද නැත. හෙට අනිද්දා සවුදි වධකයා රිසානා නෆීක්ගේ බෙල්ල කපා දමනවා ඇත.

මේ කාරණයේදී වැරදි ගොඩක් සිදුවී තිබේ. ඒවා පුවත්පත්වල පළවිය. ඒවා එකින් එක විස්තර කිරීම පසෙක තබා මේ සියල්ලට මූලික වූ දේවල් ගැන පමණක් වචන කීපයක් පැවසීම අපේ අදහසයි.

ශ්‍රීලාංකිකයෝ දස ලක්ෂයකට වඩා එනම් ලාංකික ජනගහනයෙන් සෑම 19 දෙනෙකුගෙන් 1 කෙනෙක් මැද පෙරදිග රැකියාව ට ගොස් සිටිති. කාන්තාවෝ ලක්ෂ 6 ක් ගෘහසේවිකාවෝ වෙති. ඒ නිසා ම සවුදි අරාබිය වැනි රටවල දැන් ශ්‍රීලංකාව හඳුන්වන්නේ හවුස්මේඩ්ස්ලාගේ රට (Sri Lanka -the country of housemaids) යනුවෙනි. මෙය කිසිසේත් නම්බුනාමයක් නොව අප රට වැටී තිබෙන පහත් අවලංගු තුට්ටු දෙකේ තත්වය ලොවට කියාපාන්නකි. එහෙත් අප රට එතරම් හැල්ලුවෙද්දී රට කරවන අය බැලුවේ මැදපෙරදිගට ගිය කාන්තාවන් උපයාගෙන එන රියාල් ඩිනාම් දෙසය. එමගින් රටේ වියදම පියවාගන්නටය. රුපියල් බිලියන 300 ක් වන ශ්‍රීලංකාවට අවුරුද්දකට ලැබෙන විදේශ ඉපයීම් වලින් කාලක්ම ගෙන එන්නේ රිසානා වැනි ගෘහසේවිකාවන්ය. මැති ඇමති-වරුන්ට හිතේ හැටියට නැති නාස්ති කරන්නට, සුඛෝපභෝගී කාර් ගෙන්වන්නට, පිට රටට සවාරි යන්නට, ඔවුන්ගේ දරුවන් විදේශයට යවා උගන්වන්නට වැයකරන්නේ රිසානා වැනි ලක්ෂ හයක් ලංකා ගැහැණුන් කුණුබැනුම් අසා, ගුටිකා, කසපාරවල් කා, අනේක වධහිංසා විඳ, දූෂණයට ලක්ව රටට හම්බ කරගෙන ඒ විනිමය මුදල්වලිනි. එහෙත් ඒ එකද ගැහැණියක් විපතට පත්වූ විට ඇය බේරාගන්නට ඉදිරි-පත්වන, කතාකරන එක ද මැති ඇමතියෙකු නැත. පුවත්පත් වලින් දසලක්ෂ වාරයක් පෙන්-නුම්කර දුන්නද ඒවා කණට ගත් ලොක්කෙක් අප රටේ නැත. ඉදිරියටත් එසේම ය.

සවුදි අරාබියේ පිටරටින් එන සේවක සේවිකාවන්ට සලකන්නේ වහලුන්ට මෙනි. ඔවුන් පහත්, අපවිත්‍ර මනුෂ්‍ය කොටසක් ලෙස එහිදී සැලකේ. ඔවුන් සමග හිතවත් වීමක් හෝ හොඳින් කතා කිරීමක් හෝ නැත. දරුණු වධ දීම් වලට ගොදුරුව සේවකයෙකු උසාවියට ඉදිරිපත් කළත් ඔහුට / ඇයට අරාබි උසාවියේ අනුකම්පාව නොලැබේ. සේවකයින්ට වධහිංසා කිරීම අපරාධයක් ලෙස එම රටේ නොසලකති. එසේ කිරීම ස්වාමියාගේ අයිතියක් බව නඩුකාරයා කියයි. මක්නිසාද සේවකයා එම අරාබිකාරයාගේ වහලායයි එහි පිළිගන්නා නිසාය.



# සංසාර ගැට ලිහන ඉල් මහ

ඓතිහාසික වාග් විද්‍යාවේ මූල ධර්මයන්ට අනුව සිසිල යන වචනයත්, ලිහිල් යන වචනයත් භාවිතයෙන් පරිණාමයට පත්වෙලා, සරල වී, ලිහිල් වී ඉල් බවට පත්වෙන්න පුළුවන්. ලිහිල් හා සිසිල් යන වචන දෙකේම අර්ථය ඉල් මාසයට ගැලපෙන නිසා ඉල් මාසෙ යන්න අර්ථාන්විත යෙදුමක්. සිල් යන වචනයෙ තියෙන්නෙත් එහි මුල් ස්වරූපය වූ සිසිල් යන වචනයෙ තේරුමයි. සිල් වලින් කෙරෙන්නෙත් සිත කය වචනය සංවරවෙලා, සෞම්‍ය වෙලා සිසිල් වෙන එකයි. ඒ සිසිල්වීම තමා සියළුම දුක්ගිනි නිවන නිවනට පදනමක් වෙන්නෙ. සිතක් සිසිල් වී, නිවිලා, නිවන් දැකීම සිද්ධවෙන්නෙ සිත් රත්කරන ඇලීම් නමැති සංසාර බන්ධන නොහොත් සසර බැමි ලිහිල් වී ගැලවුනාමයි. ඇලවිලා, තදවෙලා, ගැටගැහිලා තියෙන දේවල් ගැලවෙන්නෙ ඒ ගැටගැහිලි ලිහිල් වෙලයි. ලලනාවන් නටනකොට ගැට ගැහිලි ගැලවිලා ලිහිල් වෙන වස්ත්‍ර සඳහා **ඉහිල් වසන්** යන වචන පැරණි සිංහල කාව්‍යවල යෙදිලා තියෙනවා.

ඉහිල් යන වචනය හැදෙන්නෙ ලිහිල් යන වචනය සරල වෙලයි. මේ ඉහිල් යන වචනය තවත් ලිහිල් වෙලයි ඉල් බවට පෙරළෙන්නෙ. එක අතකින් ඉල්මාසෙට ඒ නම ලැබිලා තියෙන්නෙ ඉංග්‍රීසියෙන් **Autumn** ඕටම් කියන සරත් සමය අවසන්වෙන ඉංග්‍රීසි නොවැම්බර් නොහොත් සිංහල ඉල් මාසෙදි උතුරු ඉන්දියාවෙත්, එංගලන්තය වැනි සම ශීතෝෂ්ණ රටවලත් ගස්වල කොළ ඉදිලා, ලිහිල් වෙලා, ලිහිලා සුළඟට වැටෙන නිසයි. ඒ අනුව ඉල් මාසය යනු කොළ ලිහිල් වී ගැලවී හැලෙන මාසයයි. හිම වැටෙන තරම් සීතල උඳුවප් හා දුරුතු යන මාසවලට පෙර ලබන ඉල් මාසය යනු කාල ගුණය සිසිල් වන මාසයක්. බුද්ධ ශාසනයෙ ප්‍රථම ඉල් පුර පසළොස්වක් පෝදා බුදුහාමුදුරුවො රහතන්වහන්සේලා හැට නමක් නා නා දිශා භාගයන්හි චාරිකාවෙ යෙදෙව්වෙ ඒ ආර්යයන් වහන්සේලා මුළුමනින් සිත්සතන් නිවාගෙන භුක්තිවිඳින නිවන් සිසිල එය ලබාගැනීමේ වාසනාව ඇති ලෝක සත්වයින්ටත් බෙදා දී අධ්‍යාත්මික සිසිලක් ලොව පතුරුවන්නයි. රහත් සිත්වල මතුවෙන නිවන් සිසිලස දැනෙන්නෙ නිවන් දකින වාසනාව නොහොත් හේතු සම්පත් අවදිවෙලා තියන වික්ෂ්කඳාණවන්තයින් නොහොත් සහෘදයන්යයි කිවහැකි සංවේදී පුද්ගල යන්ටයි. විනෙය ජනයන් කියන්නෙ එවැන්නන්ටයි. නිවන් එවැන්නන් විසින් අත්දැකිය හැකි බවයි වේදිතබ්බො වික්ක්ඤූහි යන්නෙන් කියවෙන්නෙ.

පසු කාලයේදී ධර්ම සේනාපති මහ සැරියුත් හිමියන් බවට පත් වූ උපතිස්ස පරිබ්‍රාජිකයන්ට අස්සජී මහරහතන් වහන්සේ දුටු මොහොතෙම ඒ උත්තමයන් සපුරා සිත නිවාගත් ආර්‍යයි වහන්සේ නමක් බව දැනුණෙ බණ අහල නෙවෙයි. ඒ පරිබ්‍රාජිකයා තුළ අවදි වී තිබුණු වික්ඤ්ඤාණවන්ත භාවය නමැති සංවේදිතාව නිසයි.

බුදුහිමියන් දම්සක් සුතුර දෙසා ඉසිපතනයෙහි වැඩවසද්දී බරණැස සිටි යසකුල පුත්‍ර නමැති සිටුකුමරාට ගිහි සැප ගැන කළකිරී මහණදම් පුරා නිරාමිස නිවී සැනසිල්ලක් සොයන සිත් පහළවූයේ සියළුම සංසාර බන්ධන නමැති ගැට ලිහාගෙන සපුරා සිත් සතන් නිවාගත් බුදුහිමියන් ගේ බුද්ධ ශක්තිය වික්ඤ්ඤාණ ගතවී මෙන් විය යුතුයි. බුදුහිමියන් බුද්ධ ශාසනයේ ප්‍රථම ඉල්මස පුන් පෝදා රහතන් වහන්සේලා හැටනමක් නානා දිශා භාගයන්ට පිටත්කර හැරියේ වික්ඤ්ඤාණ වන්තයින් නමැති විනෙය ජනයන්ට සිත්සතන් සිසිල්කර නිවාගෙන නිවන් සුවය භුක්ති විඳිය හැකි අරිය මඟ හෙළිකරන්නයි. ගිනිගෙන දැවෙන පෘතග්ජන හදවත් නිවන් සුවයෙන් සිසිල් කරනු සඳහායි.

ඉල් මාසය නිවන් සිසිල ලබාගැනීම සඳහා ලොවුතුරු නුවණ අවදිකරන්නේ කොළ හැලී ඉපල් බවට පත්වෙන ගහකොළ දෙස බලන විට අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ අවබෝධ කරවීම මගිනුයි. ඒ සිසිල තමතමන් තුළින් මතුවන්නේ ඉල්මාසයේ කොළ හැලී යන පරිදි ඇලීම් නමැති සංසාර ගැට ලිහිල් වී ගැලවී යන විටයි. අප කවදා හරි නිවන් දකින්නෙත් සංසාර බන්ධන නමැති සියළුම ඇලීම් නොහොත් ගැට ලිහී ගිය විටයි.

♦ ***සම්මානිත මහාචාර්‍ය ටී. එස්. අබේවික්‍රම*** **Harrow UK**

## The Paradoxes of Our Age අපට වෙච්ච දේ

We have conquered outer space, but not inner space; we've done larger things, but not better things; we've cleaned up the air, but polluted the soul; we've split the atom, but not our prejudice; we write more, but learn less; plan more, accomplish less.

**අපි අජටාකාශය ජය ගත්තෙමු. එහෙත් අපේ ඇතුළත ජය ගන්නට අපට නොහැක. ලොකු දේවල් කර ඇත්තෙමු. එහෙත් හොඳ දේවල් නොකළෙමු. පරිසරය පිරිසිදු කරන්නෙමු. එහෙත් අධ්‍යාත්මය පිරිසිදු කරගන්නට අපට බැරිය. පරමාණුව බින්දෙමු. එහෙත් අපේ පක්ෂග්‍රාහී සිතුම් අපට බිඳිය නොහැක. හුඟක් දේ ලියන නමුත්, ඉගෙන ගන්නේ ඉතා ටිකකි. බොහෝ දේ අපි සැළසුම් කරන්නෙමු. එහෙත් ඉටුකරගන්නා දේවල් ඉතාම අඩු ය.**

## A Zen Story



### The Nature of Things

Two monks were washing their bowls in the river when they noticed a scorpion that was drowning. One monk immediately scooped it up and set it upon the bank. In the process he was stung. He went back to washing his bowl and again the scorpion fell in. The monk saved the scorpion and was again stung.

The other monk asked him, "Friend, why do you continue to save the scorpion when you know its nature is to sting ? "

" Because," the monk replied, " to save it is my nature."

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

**අර්ධො ඝටො ඝොෂණ මෙත්‍යදර්භං
සම්පූර්ණ කුම්භො නකරොති ශබ්දම්
ප්‍රහීණ විද්‍ය: ප්‍රකරොති ගර්වම්
සම්පූර්ණ විද්‍යො නකරොති ගර්වම්**

***අර්ථය :*** *අඩු කළයෙහි දිය චංචලවේ. පිරුණු කළයෙහි දිය චංචල නොවේ. නොසැලේ. එමෙන් හීන විද්‍යා ඇත්තෝ (ඉගෙනීමෙන් අඩු අය) බොහෝ ගර්ව හෙවත් ආඩම්බර බවට පැමිණේ. උගත්කමින් පරිපූර්ණ වූයේ ගර්ව රහිත වේ.*

සිංහළ බස් වහරේ දැනට අඩු වුවද පෙර නිතරම අසන්නට ලැබුණු ආප්තෝපදේශයකි **පිරුණු කළේ දිය නොසැලේ** යන්න. ඊට සම්බන්ධ සංස්කෘත සාහිත්‍යයේ එන පද්‍යයයි මා ඉහතින් දක්වා ඇත්තේ. සමාජයේ කොතෙකුත් අපට මුණගැසෙන සම හර චරිතයන්හි එක් ලක්ෂණයක්, පුද්ගලයෙකු සතු දුර්වල තාවක් ලෙස එය සියුම්ව හාස්‍යයට ලක්කර ඇති අයුරු මින් පැහැදිලි කෙරේ. කෙනෙකු ගුණ සහ නැණ යන දෙකෙන්ම යුතු වූවෙකු නම් ඔහු පිරිපුන් වාසනාවන්තයෙකු ලෙස සමාජය විසින් වැළඳගනු ලබනු ඇත. සමාජයෙන් බුහුමන් ලබනු ඇත. එසේ නොවී ගුණවත් බව පසෙක ලා නැණවත් බව පමණක් ප්‍රකටකරන දැන උගත් කෙනෙකු එයින් ලොකු ආඩම්බරකමක් ගර්වයක් සිතට ගෙන කටයුතු කරන්නේ නම් එවැන්නන්ය ඉහත සඳහන් පද්‍යයෙන් හාස්‍යයට ලක්කර ඇත්තේ.

දැන උගත්කමින් සම්පූර්ණ වෙත්ම නිහතමානීවීම නියම විද්‍යාර්ථීන්ගේ ලක්ෂණය. ඇතැම් අය යමක් දිව ගෑ පමණින්, අතපත ගෑ පමණින් තමා සියල්ල දත් විශාරදයෙකුයයි ගර්වයක් ආරෝපණය කරගනිමින් කටයුතු කරති. සාමාන්‍ය ව්‍යවහාරයේ හැටියට අහංකාරය, ආඩම්බරය, මාන්නය, උඩඟුකම යනාදී වචන වලින් සඳහන් වන්නේ මේ ගර්වයයි.

මෝඩයෙකුට තම මෝඩකම හැඟේ නම් එයින්ම ඔහු පණ්ඩිතයෙක් වන්නේයයි ධම්මපදය කියයි. තමා පණ්ඩිතයෙකැයි සිතන මෝඩයා ඒකාන්ත යෙන්ම මෝඩයෙකි. එවන් අය දත් යම් දෙයක් ඇත්නම් ඒ සියල්ල ඔහුගේ අනර්ථය පිණිසම පවතී. එය ඔහුගේ නුවණ නමැති හිස පොඩිකර යහපත් ගතිගුණ නසාලයි. එමෙන්ම හිස් බවින් යුතු ඔහු අනුන්ගෙන් ගරු බුහුමන්ද, පෙරටුබව හා පුද සැලකිලි කැමති වේ.


කෙනෙකු කෙරෙහි ඥාණ බලයට අමතරව රූප බලය, ධන බලය, ඥාතිබලය, පුත්‍ර බලය හා සීල බලය ඇත්නම් ඔවුන් ඉතා වාසනාවන්තය. ඥාණ බලය හා තවත් එක් බලයක් තිබේ නම් තරමක් වාසනාවන්තය. එහෙත් අනෙක් හැම බලයක්ම තිබී ඥාණ බලය නැත්නම් ඔවුන් අවාසනාවන්තය.

බෞද්ධ සාහිත්‍යයේ නිරහංකාරත්වයේ පරමාදර්ශයන් ලෙස සැරියුත් මුගලන් ආනන්ද ආදී රහතන් වහන්සේලා ගත හැකිය. වරක් සැරියුත් මහ රහතන් වහන්සේගේ සිවුරේ කොණක් පොළවේ තැවරෙනු දුටු කුඩා රාහුල හිමි පෙන්වා දුන් විට නිහතමානීව උන්වහන්සේ එය පිළිගෙන එයට කෘතඥතාවය දක්වා ඇත. නිහතමානීබව සම්බන්ධයෙන් උපමා රැසක් දක්වා ඇත. ඒ මහ පොළව, ජලය, ගින්න, සුළඟ සහ පාපිස්න ආදියයි. මහ පොළව මත හොඳ දේ මෙන්ම අපවිත්‍ර දෑ කොපමණ ප්‍රමාණයක් දිනකට දමනු ලබන්නේද? ඒ හොඳ නරක සියල්ල මහ පොළව විසින් එක ලෙස උසුලනු ලබයි. ජලයද ඇතුළු අනෙක් දේවල්ද එසේය. මෙහි ඇති වැදගත්ම උපමාව පාපිස්න යි. කොතෙක් දෙනා ඒ මත පා දූවිලි පිස දැමූවද පාපිස්න ඒ සියල්ල සම සිතින් උසුලයි. බුද්ධිමත් මිනිසාගේ ස්වභවය ද එය විය යුතුය. කෙනෙකු තමා උගත් දෙය නිසා බැබලෙන්නේ එයත් සමග නිරහංකාර වුවොත් පමණි.

පිරුණු කළය හඬ නගන්නේවත්, සෙළවෙන්නේවත් නැත. බුද්ධිමතාද තමා දන්නා දෙයින් නිහඬව සමාජ මෙහෙවරක යෙදෙයි. ඔහු සමාජයේ බුහුමනට ලක්වේ. නමුත් අඩු කලය හඬ නගමින් සෙලවෙන්නාක් මෙන් යමෙක් ටිකක් දැනගෙන ගර්වයෙන් පිම්බී බොහෝ දේ දන්නෙකැයි හඟවන්නට යාමෙන් නිරතුරු සමාජයේ හාස්‍යයට ලක්වේ.

♦ ***රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***

***ලන්ඩන් බෞද්ධ විහාරය***
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**



**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**